"# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/76 - 2018 ඔක්තෝබර් මස 05 වැනි සිකුරාදා - 2018.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ අටවන උපලේඛනයේ පරිදි පළාත් සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවන ලද 1992 අංක 04 දරන මධ්‍යම පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 24(2), (1), (xii), (xiii) හා 24(3) සහ මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තියේ 20 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝගය

1992 අංක 04 දරන මාර්ගස්ථ හා මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 24(2), (1), (xii), (xiii) වගන්තිය හා මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියේ මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මා වෙත පැවරී ඇති බලතල අනුව වර්ෂ 2016.10.29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1990/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග අවලංගු කර වර්ෂ 2016.10.27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1990/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ''සහසර'' නමින් හඳුන්වනු ලබන නව ප්‍රවාහන ක්‍රමවේදය පිළිබඳ පනවන ලද නියෝගයට වැඩිමනත් වශයෙන් පහත නියෝග පනවනු ලබන අතර එය මෙම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට බල පැවැත්විය යුතු බවද මෙයින් නියෝග කරමි.

1. (i) අමාත්‍යවරයාගේ නියෝගයේ සඳහන් දිනයේ සිට මාස 36ක් ඇතුළත මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පළාත තුළ බස් රථ ධාවන මාර්ග එකක් හෝ කිහිපයක් හෝ එකතු කිරීමෙන් ධාවන ඒකක හඳුනාගෙන ප්‍රකාශයට පත්කර අවසන් කළයුතු බවටත්,

   (ii) ප්‍රකාශයට පත්කළ ධාවන ඒකක නව ක්‍රමවේදයට අනුව පරිපාලනය කිරීම සඳහා බස් සේවා කළමනාකරුවෙකු පත්කළ යුතු බවටත්,

   (iii) ප්‍රකාශයට පත්කළ ධාවන ඒකක එකක් හෝ කිහිපයක් හෝ වෙනුවෙන් ධාවන පාලන ඒකකයක් බැගින් ස්ථාපිත කළයුතු බවටත්,

1A PG 4217 — 22 (2018/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. (i) මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් ධාවන ඒකක ප්‍රකාශයට පත් කරන දිනයේ සිට හෝ අධිකාරිය විසින් විශේෂ වශයෙන් නියම කරනු ලබන කාල සීමාවක් ඇතුළත හෝ එකී ධාවන මාර්ගයේ හෝ ධාවන මාර්ග කිහිපයේ හෝ අවසර පත්‍රලාභීන් එම ධාවන ඒකක වෙනුවෙන් එම මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් (1)ii අනුව පත් කරන ලද කළමනාකරුගේ පරිපාලනය යටතේ අවසර පත්‍රයෙන් අනුමත කර ඇති ධාවන මාර්ගයේ හෝ ධාවන මාර්ග වල මගී ප්‍රවාහන සේවා සැපයිය යුතු බවටත් එම කළමනාකරු විසින් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධීක්ෂණයට යටත්ව වරින් වර නියම කරනු ලබන කාලසටහන් හා නියාමන නියෝග හා සේවා ප්‍රමිතීන්ට අනුව වන බස් රථ ධාවනය කරවිය යුතු බවටත්,

(ii) බස් රථ මගින් කරනු ලබන මගී ප්‍රවාහනයෙන් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් විද්‍යුත් ටිකට් යන්ත්‍ර හරහා උපයා ගනු ලබන සියලු ආදයම් තාක්ෂණික බිඳවැටීමක් හේතුවෙන් විද්‍යුත් යන්ත්‍ර රහිතව උපයාගනු ලබන ටිකට් ආදයම් හා වෙනත් සියලු ආදයම් ද මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් අනුමත කරනු ලබන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් වාණිජ බැංකුවක ''මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය'' නමින් වූ ගිණුමකට ප්‍රේෂණය කළයුතු බවටත්,

(iii) මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් අනුමත කරන ලද මනා තත්ත්වයෙන් යුතු ජී. පී. එස්. (G. P. S.) සී. සී. ටී. වී. (C. C. T. V.) හා ජී. පී. ආර්. එස් (G. P. R. S.) තාක්ෂණය සහිත විද්‍යුත් ටිකට් යන්ත්‍ර සවිකර භාවිතා කරනු ලබන මනා තත්ත්වයෙන් යුතු බස්රථවලට පමණක් මගී ප්‍රවාහනයට අවසර දියයුතු බවටත්,

(iv) තාක්ෂණිකමය බිඳවැටීමකදී හැර සියලු අවස්ථාවන්හි දී මගීන්ගෙන් ගාස්තු අයකිරීම විද්‍යුත් කාඩ්පත් හරහා පමණක් සිදුකළ යුතු බවටත්,

(v) බස් රථවල සවිකරන ලද හා භාවිතයට යොදවන ලද විද්‍යුත් තාක්ෂණික උපකරණ වලින් තොරතුරු හා දත්ත ලබා ගැනීම සඳහා අංග සම්පූර්ණ ධාවන පාලන මැදිරියක් ආරම්භකර පවත්වාගෙන යා යුතු අතර එම තොරතුරු හා දත්ත අත්පත්කර ගැනීම, සුරක්ෂිත කිරීම, හා බස් සේවාවල කාර්යක්ෂමතාවය සඳහා උපයෝගිකර ගැනීම කළ යුතු බවටත්,

(vi) එක් එක් ධාවන මාර්ගයක හෝ ධාවන මාර්ග පංතියක බස් රථයක් ධාවනය කළ යුතු අවම කිලෝමීටර් ප්‍රමාණය හා ඒ ඒ ධාවන මාර්ගයේ ලැබෙන ආදයම හා සපයනු ලබන මගී ප්‍රවාහන සේවයේ ප්‍රමිතිය මත පදනම්ව එම එක් එක් ධාවන මාර්ගයේ හෝ ධාවන මාර්ග පංතියේ බස් රථ හිමිකරුවන්ට ධාවනය කරන එක් කිලෝමීටරයකට ගෙවිය හැකි උපරිම රුපියල් ප්‍රමාණය මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් වරින් වර ප්‍රකාශයට පත් කළයුතු බවටත්,

(vii) තම බස් රථයේ සේවය කරන සේවක මහතුන් සඳහා සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දයක මුදල් නිසි පරිදි ගෙවා ඇති බවට නියමිත ලේඛන ඉදිරිපත් කරන අයිතිකරුවන්ගේ බස්රථවලට පමණක් ධාවන අවසරය ලබාදිය යුතු බවටත්,

(viii) ධාවන මාර්ගයක හෝ ධාවන මාර්ග පංතියක ධාවනය කරන බස් රථ වල විද්‍යුත් තාක්ෂණික උපකරණ සවිකිරීමෙන් පසු මාස 02ක කාලයක් නියමිත පරිදි ධාවනය කර ඇති බව සනාථ වන බස් රථ පමණක් ''සහසර'' ධාවන ක්‍රමයට ඇතුළත් කරගත යුතු බවටත්,

(ix) බස් රථ සංචිත ලෙස ''සහසර'' සන්නාමකරණය කළයුතු බවටත්,

(x) ධාවන පාලන මැදිරියේ කළමනාකරණය මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් හෝ අධිකාරියේ අනුමැතිය ලැබූ බස් සේවා කළමනාකරුවෙකු විසින් හෝ සිදුකළ යුතු බවටත්,

(xi) ප්‍රවාහන සේවාවල මනා කාර්යක්ෂමතාවය හා නිවැරදි ප්‍රවේශපත්‍ර ගණුදෙනු සිදුවන්නේ ද යන්න පරීක්ෂා කරවීම පරීක්ෂක කණ්ඩායම් පත්කර ඔවුන්ට අවශ්‍ය අධිකාරී බලය පැවරීම මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් සිදු කළ යුතු බවටත්,

(xii) මහජන පැමිණිලි කාර්යක්ෂම ලෙස කළමනාකරණය සඳහා සුදුසු ඒකකයක් අධිකාරිය යටතේ පිහිටිවිය යුතු බවටත්,

(xiii) විද්‍යුත් ගෙවීම් කාඩ්පත් පරිහරණය ප්‍රචලිත කිරීම සඳහා යෝග්‍ය දිරිගැන්වීම් ලබාදිය යුතු බවටත්,

3. ඉහත 1 හා 2 වන නියෝග වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට මධ්‍යම පළාතේ සියලුම ධාවන මාර්ග සඳහා අදාල වන බවටත්,

4. සේවා තත්ව පාලන සහ මගී සුව පහසුව පිළිබඳව සියලු බලතල සහ නව සේවා හඳුන්වාදීම පිළිබඳ සියලු තීරණ මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය සතු බවටත්,

5. (i) මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් තාක්ෂණික හා මූල්‍ය විගණනය සඳහා සුදුසුකම් ලත් විගණකවරුවන් ප්‍රකාශයට පත්කර ධාවන ඒකකය විගණනය කිරීම කළ යුතු ය.

(ii) එකී විගණන වාර්තා බස් රථ ධාවන අවසරපත්‍රලාභීන්ට අවශ්‍ය අවස්ථාවකදී පරීක්ෂාකර බැලීමට පහසුකම් සලසාදිය යුතුයි.

(iii) තවද, එකී වාර්ෂික විගණන වාර්තාව විෂය භාර අමාත්‍යවරයා මගින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

එදිරිවීර වීරවර්ධන,
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති
සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,
මධ්‍යම පළාත.

තැ. පෙ. 104, අංක 109,
යටිනුවර වීදිය,
මහනුවර.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.